දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி )
E-mail ) postmaster@health.gov.lk

වෙබ් අඩවිය )
இணையத்தளம் )
Website ) www.health.gov.lk


මගේ අංකය )
எனது இல. )
My No. ) CF/EXU/06/2022

ඔබේ අංකය )
உமது இல. )
Your No. )

දිනය )
திகதி ) 2022/10/07
Date )


සුවසිරිපාය
சுவசிரிபாய
**SUWASIRIPAYA**

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
**Ministry of Health**


පොදු චක්‍රලේඛ ලිපි අංක :- **02 – 87/ 2022**

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ
අධ්‍යක්ෂ - ජාතික රෝහල, මහනුවර
රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
අදාල ආයතන ප්‍රධානීන් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MT-06) වැටුප් පරිමාණයේ අතුරු වෛද්‍ය සේවයේ II "ආ" ඛණ්ඩය / III ශ්‍රේණියේ සෞඛ්‍ය කීට විද්‍යා නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022 (පළමු වාරය)**

අතුරු වෛද්‍ය සේවයේ II "ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ සෞඛ්‍ය කීට විද්‍යා නිලධාරීන් සඳහා II "ආ" ඛණ්ඩයට / III ශ්‍රේණියට උසස් වී වසර තුනක් ගත වීමට පෙර සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන දිනය, ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02. සුදුසුකම්**

මෙම විභාගයට අයදුම් කළ යුත්තේ සෞඛ්‍ය කීට විද්‍යා නිලධාරී II පන්තිය "ආ" ඛණ්ඩයට / III ශ්‍රේණියට පත්වීමක් ලබා, මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන් පමණි.

**03. අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කර ගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යක්ෂ (විභාග) වෙත **2022/11/09** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර එම ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවර **"III ශ්‍රේණියේ සෞඛ්‍ය කීට විද්‍යා නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022 (පළමු වාරය)"** ලෙස සඳහන් කළ යුතුය. **මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියා විසින්ද, සෑම අයදුම්පත්‍රයකම දක්වා ඇති තොරතුරු සියල්ල නිවැරදි බවට ආයතන ප්‍රධානියා විසින්ද සහතික කර තිබීම අනිවාර්යය වේ.** තම අයදුම්පත සමඟ රාජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු. 110.00 ක් වටිනා මුද්දර ඇලවූ 9" X 4" ප්‍රමාණයේ **ලියුම් කවරයක් (01)** ද එවිය යුතුය. **ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**



385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

*සැ.යු. : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව අයදුම්පත්‍රය A4 කඩදාසියක පළමු පිටුවේ අංක 01-04 දක්වාත් දෙවන පිටුවේ අංක 05-09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.*

**04. විභාග ගාස්තු**

4.1 විභාගයට පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තු වලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකළ මුද්දර අයදුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා ඒවා නිසි ලෙස අවලංගු කළ යුතුය.

4.2 කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

**05. විභාගයට ඇතුලත් කර ගැනීම**

5.1 පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂක / අපේක්ෂිකාවන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

5.2 විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මඟින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

**06. විභාග පරිපාටිය**

මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය, **ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති** යනුවෙන් සහ **මුදල් රෙගුලාසි** යනුවෙන් විෂයන් දෙකකින් සමන්විත වේ. සෑම විෂයක් සඳහාම ලකුණු 100 බැගින් වෙන් කෙරෙන අතර, කාලය පැය 03 බැගිනි. සමත් වීම සඳහා සෑම විෂයකටම අවම වශයෙන් ලකුණු 40ක් ලබාගත යුතුය. එක්වරකදී හෝ කිහිපවරකදී විෂයන් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය.

**පළමුවරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියලුම විෂයයන් අයදුම් කළ යුතුය.**

**07. විෂය නිර්දේශය**

**7.1 ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති ප්‍රශ්න පත්‍රය**

රචනා මාදිලියේ ප්‍රශ්න 08කින් සමන්විත වන අතර, ඉන් ඕනෑම ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුය.

**ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති මත සැකසේ:**

IV වන පරිච්ඡේදය - මාස් පඩි, තාවකාලික තත්ත්වය, ස්ථිරත්වය සහ විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කිරීම

**ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද:**

XII වන පරිච්ඡේදය - නිවාඩු
XIII වන පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර
XIV වන පරිච්ඡේදය - දිවයින ඇතුලත රාජකාරි ගමන්
XIX වන පරිච්ඡේදය - රජයේ නිවාස
XLVII වන පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම හා විනය
XLVIII වන පරිච්ඡේදය - විනය කාර්ය පටිපාටිය පිළිබඳ රීති


385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

7.2 මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය

රචනා මාදිලියේ ප්‍රශ්න 08කින් සමන්විත අතර, ඉන් ඕනෑම ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුයි.

- මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත පරිච්ඡේද

| | | |
|---|---|---|
| I වන පරිච්ඡේදය | - | වියදම් හා ආදායම් ඇස්තමේන්තු, ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම. (මු. රෙ. 01 සිට මු. රෙ. 68 දක්වා) |
| III වන පරිච්ඡේදය | - | මුල්‍ය කලමනාකරණ හා උත්තරදායී බව. ප්‍රධාන ගණක නිලධාරී, ගණක නිල ආදායම් ගිණුම් නිලධාරීන්, ගෙවීම් සඳහා බලය ලබා දීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්යය පැවරීම. ( මු. රෙ. 124 සිට මු. රෙ. 147 දක්වා) |

**08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

**09.** කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයේ නියුතු **සෞඛ්‍ය කිට විද්‍යා සේවයේ** II "ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න.

(මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියෙන්ද ලබා ගත හැකිය.)

**Web Path** :- www.health.gov.lk ⟶ Staff Access ⟶ Admin ⟶ Circulars

**සැ.යු. - මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතු වුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.**

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.


385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

**EXU**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

## ආදර්ශ අයදුම්පත

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MT-06) වැටුප් පරිමාණයේ අතුරු වෛද්‍ය සේවයේ II "ආ" ඛණ්ඩය / III ශ්‍රේණියේ සෞඛ්‍ය කිට විද්‍යා නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022 (පළමු වාරය)**

01 (අ) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) : ……………………………………………………

……………………………………………………………………………………

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(iii) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ……………………………………………………

……………………………………………………………………………………

(iv) මුලකුරු වලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ආ)

(i) III ශ්‍රේණියට පත් වූ දිනය : ……………………………………………………

(ii) දැනට ලබන වාර්ෂික වැටුප : ……………………………………………………

(iii) ජංගම දුරකථන අංකය

(iv) ජාතික හැඳුනුම්පත් අංකය

(v) විද්‍යුත් ලිපිනය : ……………………………………………………

02 ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (x) ලකුණ යොදන්න.

ආයතන සංග්‍රහය හා කාර්ය පරිපාටික රීති ☐ මුදල් රෙගුලාසි ☐

03 (අ) දැනට සේවය කරන ආයතනය (සිංහලෙන්) ……………………………………………………

(ඉංග්‍රීසියෙන්) ……………………………………………………

(ආ) එය අයත් දිස්ත්‍රික්කය ……………………………………………………

(ඇ) එම සේවා ස්ථානය අයත් වන්නේ - මධ්‍යම රජයටද ☐

- පළාත් සභාවටද ☐

(ඈ) පළාත් සභාවේ නම් අදාල පළාත ……………………………………………………

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු. 110.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පතට අමුණන ලද්දේද? ……………………………

(ඊ) (i) තැපැල් ලිපිනය ( සිංහලෙන් ) ……………………………………………………

……………………………………………………………………………………

(ii) තැපැල් ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් ) ……………………………………………………

……………………………………………………………………………………

04 විභාගයට පෙනී සිටින මාධ්‍යය ( සිංහල / දෙමළ / ඉංග්‍රීසි ) ……………………………………………………

05 (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ..................................................................

(ආ) අයදුම්පත ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේ නම් මුද්දර අලවා තිබේද? ........................................

| මුද්දර කොටුව |
|---|

---

06 **අයදුම්කරුගේ සහතිකය**

**මගේ දැනුම හා විශ්වාසය පරිදි**

(අ) මෙම අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වතාවට නොවන බැවින් රු ............... ක් වටිනා මුද්දර අලවා ඇති බවත්, මෙම අයදුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

දිනය ......................

..........................................

අයදුම්කරුගේ අත්සන

---

07 **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිළධාරිවරයා / නිළධාරිනියගේ සහතිකය**

මෙම අයදුම්පත් භාරගන්න අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය ................................ ..........................................

නම සහ අත්සන

---

08 **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

.......................................................... මහතා/මහත්මිය/මෙනවිය ..........................................

නිළධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, අයදුම්පතේ ඇතුලත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අයදුම්කරු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත් / නොවන බවත්, රු 25ක් වටිනා මුද්දර මෙම අයදුම්පත්‍රයට අලවා ඇති බවද, විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්,මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි.

දිනය ........................ ..........................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

[රබර් මුද්‍රාව තැබිය යුතුය]

---

09 **විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර* ප්‍රධානියාගේ සහතිකය**

................................................................................ මහතා / මහත්මිය / මෙනවිය,*II වන පන්තියේ "ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ **සෞඛ්‍ය කිට විද්‍යා** නිලධාරියෙකු වශයෙන් මාගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය ......................... ..........................................

විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන

[රබර් මුද්‍රාව තැබිය යුතුය]

* - අනවශ්‍ය කොටස් කපා හරින්න.